# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2086/31 - 2018 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාව

### බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද සංශෝධන රීති

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 06 දරන සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 23 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාත් සභාවේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍ය කැප්ටන් ලලිත් වනිගරත්න වන මම, එකී වගන්තිය යටතේ සාද අංක 1698/22 හා 2011 මාර්තු මස 24 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති පහත පරිදි සංශෝධනය කරමි. මෙම සංශෝධන රීති *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට බල පැවැත්විය යුතුය.

(1) 3(2) රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්, ඒ රීතිය මෙසේ සංශෝධනය කරනු ලැබේ.

**3(2) රීතිය සංශෝධනය**

මෙම රීතියෙහි ඇතුළත් කර ඇති කාරණාවලට අනුව මෙම රීති ක්‍රියාත්මක වූ දිනෙන් පසු ස්ථිර සේවයට බැඳෙන සේවකයෙකු, බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් තම සේවය ස්ථිර කළ දින සිට දින 90ක කාලයක් ඇතුළත දී මෙම රීති මගින් නියම කර ඇති ආකාරයට අනුව සකස් කර ඇති ඉල්ලුම් පත්‍රයක් සම්පූර්ණ කර අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) 3(2) රීතියට ඉක්බිතිව 3.(3) ලෙස පහත දැක්වෙන නව රීතිය ඇතුළත් කිරීම

**3(3) නව රීතියක් ඇතුළත් කිරීම**

බස්නාහිර පළාත් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දයකත්වය ලබාදීම පිළිබඳව යම්කිසි ගැටලු සහගත තත්ත්වයක් මතු වුවහොත් අධ්‍යක්ෂවරයා පාලක මණ්ඩලයේ එකඟත්වය මත තීරණයක් ගත යුතුය.

**කැප්ටන් ලලිත් වනිගරත්න,**
බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍ය.

බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ අංක 204හි
බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන
හා වෙළෙඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්,
කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

09 - 362

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A PG 4192 — 1407(2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.